2024-08

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

## කතෝලික ධර්මය

Learning Resource Center
R
De Mazenod College
Kandana

නම ..............................................................

| 7 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 |
|---|---|---|

## I කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
**අංක 1-20 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

01. "මා අනුව එන්න යැයි" ජේසුස් වහන්සේ විසින් කැඳවූ රේගු පොළේ සිටි පුද්ගලයා වූයේ
(i). මතියෙස් ය. (ii). මාක් ය. (iii). මතෙව් ය. (iv). ජොහන් ය.

02. ජුදාස්ගේ මරණයෙන් පසු හිස්වූ අපොස්තුලුවරයා වෙනුවට තෝරාගත් අපොස්තුලුවරයා වන්නේ,
(i). මතියස් ය. (ii). මතෙව් ය. (iii). පිලිප් ය. (iv). අනනියස් ය.

03. ජේසුස් වහන්සේ අනුව ගිය ප්‍රථම ශ්‍රාවකයෙක් නොවන්නේ
(i). පේදුරු ය. (ii). ඇන්ඩෲ ය. (iii). ජාකොබ් ය. (iv). පිලිප් ය.

04. ක්‍රිෂ්මා තෛලයෙන් ආලේප නොකරන ප්‍රසාද නිධානයක් වන්නේ
(i). ප්‍රසාද ස්නාපනය යි. (ii). පූජකවරය යි.
(iii). දිව්‍ය සත්ප්‍රසාදය ය. (iv). අභිවෘද්ධි ආලේපය යි.

05. ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී භාවිත කරන සංකේතාත්මක දෙයක් නොවනුයේ
(i). මිදියුෂ යි (ii). ජලය යි
(iii). ශුද්ධ වූ තෛලය යි (iv). පාස්කු ඉටිපහන යි

06. පදවි පූජකවරු දෙනු ලබන පොරොන්දුවකි.
(i). දිළිඳු කම. ii).වෘත ශුද්ධිය. (iii). පූජක බඹසර. (iv). ඉවසීම.

(පිටු අංක 01)

07. රෝහල් සේවය, ධර්ම විවේකය පැවැත්වීම වැනි දූතික සේවාවන් කරන පැවිදි නිකාය වන්නේ
(i). සිරි කුරුස පැවිදි සොයුරියන්. (ii). සුරදූත නිකාය.
(iii). නිර්මල මරිය නිකාය. (iv). ශුද්ධ වූ පවුලේ නිකාය.

08. ආරම්භක ප්‍රසාද නිධානයකි.

(i). පූජක වරය. (ii). දිව්‍ය සත් ප්‍රසාදය.
(iii). පාපොච්චාරණය. (iv). රෝගීන්ගේ ආලේපය.

09. දස පනතේ හත්වන (7) පනත වනුයේ

(i). මව්පියන්ට සංග්‍රහ කරව. (ii). ජීවිත විනාශ නොකරව.
(iii). බොරු සාක්ෂි නොකියව. (iv). සොරකම් නොකරව.

10. සත්‍ය විකෘති කිරීම තහනම් කරන දේව පනත වන්නේ

(i). 8 වන පනත. (ii). 9 වන පනත.
(iii). 6 වන පනත. (iv). 4 වන පනත.

11. ඊසාක් යන නමෙහි අර්ථය වනුයේ

(i). ආශිර්වාදයයි. (ii). සිනාසීමයි. (iii). විශ්වාසයයි. (iv). ආලෝකයයි.

12. දෙවියන් වහන්සේ හා මිනිසා සමග පොර බදා ජයගත් බැවින් ඊශ්‍රායෙල් යන නාමය ලැබූයේ

(i). ඒසව් ය. (ii). ආබ්‍රහම් ය. (iii). ජාකොබ් ය. (iv). මෝසෙස් ය.

13. පුරාණ ගිවිසුමේ සඳහන් ආදි පීතෘ කෙනෙකු නොවනුයේ

(i). මෝසෙස් ය. (ii). ආබ්‍රහම් ය. (iii). ඊසාක් ය. (iv). ජාකොබ් ය.

14. උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේව සංකේතවත් කරන සලකුණකි

(i). කුරුසියේ ලකුණ (ii). සුදු වස්ත්‍ර.
(iii). පාස්කු ඉටිපහන. (iv). ආශිර්වාදිත ජලය.

15. ආදි පීතෘ ආබ්‍රහම්තුමාට පරිත්‍යාග කිරීමට සිදුවූ දෙයක් නොවනුයේ

(i). තමාගේ මව්බිම ය. (ii). තමාගේ නෑදෑයන් ය.
(iii). යාන වාහන ය. (iv). පියාගේ ගෘහය ය.

16. "දෙවියන් වහන්සේ ගලවන සේක" යනුවෙන් තම නමෙහි අර්ථය ඇති දිවැසිවරයා වන්නේ

(i). එසකියෙල් ය. (ii). යෙසායා ය. (iii). ජෙරමියා ය. (iv). එලියා ය

17. දේශක දිවැසිවරයෙක් නොවනුයේ

(i). එලීෂා ය. (ii). නාතාන් ය. (iii). එලියා ය. (iv). සෙකරියා ය.

18. ජාතීන්ගේ පියාණෝ යනුවෙන් නමෙහි අර්ථය ඇති ආදිපිතෘතුමා වන්නේ

(i). ආබ්‍රහම් ය. (ii). ඊසාක් ය. (iii). ජාකොබ් ය. (iv). ඒසව් ය.

19. ජේසුස් වහන්සේ අපෝස්තුලුවරුන්ට ධර්මදූත වගකීම් පැවරුයේ

(i). කුරුසියේ ඇණ ගැසීමට පෙර ය. (ii). ස්වර්ගාරෝහණය වීමට පෙර ය.
(iii). අන්තිම රාත්‍රී භෝජනයේදී ය. (iv). උතුත් වීමට පෙර ය.

20 දෙවියන් වහන්සේ ආබ්‍රහම්තුමා සමග ඇති කරගත් ගිවිසුමේ බාහිර සලකුණ වනුයේ

(i). දේදුන්නයි. (ii).දසපනතයි. (iii).චර්මජේදනයයි.(iv). පරවියා යි.

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න 05 කි

01. (i). දේශක දිවැසිවරු පිළිබඳව සඳහන් වන ග්‍රන්ථ 2 කුමක්ද ?
(ii). සුළු දිවැසිවරු 04 දෙනෙක් නම් කරන්න.
(iii). දිවැසිවරයා හඳුන්වන හෙබ්‍රෙව් වචනය හා ග්‍රීක වචනය පිළිවෙලින් ලියන්න
(iv). එලියා දිවැසිවරයා දිව්‍ය සංරක්ෂණය අත්දුටු අවස්ථා 02 ක් ලියන්න.
(v). යෙසාය හා ජෙරමියා දිවැසිවරුන්ගේ පියවරුන් පිළිවෙලින් නම් කරන්න.
(vi). ආදිපිතෘ ඊසාක්ගේ මව හා පියාගේ නම් ලියන්න.
(vii). ජනතා සේවයේ ප්‍රසාද නිධාන දෙක ලියන්න
(viii). පැවිදි පූජකවරු ලබාගන්නා වේද භාර 2 ක් ලියන්න
(ix). දෙමව්පියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම් 2 ක් ලියන්න
(x). කතෝලික පූජා ප්‍රසාදීන් වහන්සේලා බෙදෙන කොටස් දෙක ලියන්න.

02. (i). ජීවිතයේ එක්වරක් පමණක් ලබාගත හැකි ප්‍රසාද නිධාන 02 ක් ලියන්න.
(ii). පූජකවරයෙහි ඇති ධූර 3 ක් ලියන්න.
(iii). පූජා ප්‍රසාදීන් වහන්සේලා වෙනුවෙන් අප විසින් ඉටු කල යුතු යුතුකම් 5 ක් ලියන්න.

03. (i). කිතුණු විවාහයේ ලක්ෂණ දෙක ලියන්න.

(ii). ශුද්ධ වූ පවුලෙන් කිතුණු පවුලකට ලබා ගත හැකි ආදර්ශ 3 ක් ලියන්න.

(iii). ඔබගේ දෙමව්පියන් හා සහෝදර සහොදරියන් වෙනුවෙන් කිවහැකි යාච්ඥාවක් ලියන්න.

04. (i). ප්‍රසාද ස්ථාපනයෙන් අපව කැඳවන පොදු පූජකවරයෙන් අපට පැවරෙන වගකීම් 2 ක ලියන්න.

(ii). පොදු පූජකවරයෙන් ඔබට පැවරෙන වගකීම් ඉටු කිරීමට සහය වන මීසමේ තිබෙන සමිති 3 ක් ලියන්න.

(iii). පොදු පූජකවරය නමැති කැඳවීමෙන් ඔබට පැවරෙන වගකීම් තුන ඉටු කිරීමට කළ හැකි කාර්යයන් 2 බැගින් ලියන්න.

06. (i). හත්වන (7) හා අටවන (8) දේව පනත් දෙක ලියන්න.

(ii). සත්‍යගරුක සමාජයක් ගොඩ නැංවීමට ඔබට කල හැකි දෑ 3 ක් ලියන්න.

(iii). හත්වන දේව පනතින් තහනම් කරන ක්‍රියා 2 ක් හා සාධාරණව වස්තුව ලබාගත හැකි මාර්ග 3 ක් ලියන්න.

07. පහත මාතෘකා හතරෙන් දෙකක් තෝරාගෙන විස්තර කරන්න.

(i). සතර වන දේවපනත.

(ii). පූජකවරය.

(iii). ආදිපිතෘ ආබ්‍රහම්තුමා.

(iv). ජේසුස් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකයෝ.

REGISTRAR
De Mazenod College
Kandana.